**හෝමාගම ප්‍රාදේශීය සභාව**

**කොළඹ දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 **මතය**

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති හෝමාගම ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

ගිණුම් වල දක්නට තිබූ ගිණුම් දෝෂ, වියදම් හා වත්කම් වශයෙන් අවස්ථා හා අගයයන් යටතේ පහත වගුවෙහි දැක්වේ.

| | ගිණුම් වලට බලපෑම | | | |
|---|---|---|---|---|
| | වියදම් | | වත්කම් | |
| | අවස්ථා ගණන | අගය | අවස්ථා ගණන | අගය |
| | | රු. '000 | | රු. '000 |
| (අ) ගිණුම්වලින් අත්හැරීම් | | | 01 | 5 |
| (ආ) වෙනත් | 02 | 829 | 01 | 6 |

1.3.2 **නොසැසඳෙන පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 14 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 191,620,685 ක් වූ අතර, උපයෝගී ලේඛණ අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 136,765,825 ක් විය.

### 1.3.3 නිරවුල් නොකරන ලද ගිණුම්

රු. 15,424,519 ක අගයක වු ගිණුම් ශේෂ වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් තිබෙන අතර නිරවුල් කිරීමට වගකිව යුතු නිලධාරින්ගේ අවධානය යොමු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

**තොරතුරු ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 284,295,920 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.5 අනුකුල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකුල නොවීම් |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මු.රෙ 757 (2) (අ) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා එහි පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් විගණන දිනය වූ 2011 ජූලි 18 දින වන විටත් 2010 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| xxiv පරිච්ඡේදයේ 4.4,4.5 හා 4,6 | අයකර ගත නොහැකි රු. 1,931,387 ක් වූ ණය ශේෂ ප්‍රධාන ණයකරුගෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ එසේ නොමැති නම් උරුමක්කරුවන්ගෙන් හෝ අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 45,553,595 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 46,933,533 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ)** සමාලෝචිත වර්ෂය අවසානයට නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මාස 6 ක කාලයක් ඉක්මවූ එකතු වටිනාකම රු. 250,537 ක් වූ චෙක්පත් 14 ක් පොදු බැංකු ගිණුමේද, රු. 47,845 ක් වූ චෙක්පතක් පළාත් සභා ගිණුමේ ද තිබුණු නමුත් එකී චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ)** පොදු ගිණුමට හර කර තිබූ සෘජු බැර කිරීම් රු. 1,388 ක් හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

**(ඇ)** අඟරු චෙක්පත් 03ක එකතුව වූ රු. 1,875 ක් සම්බන්ධව මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර රු.725 ක අඟරු චෙක්පත සම්බන්ධයෙන් විස්තර දැක්වීමට වගකිව යුතු නිලධාරීන් අපොහොසත් විය.

### 2.3 වත්කම් පාලනය

සභාව සහ උපකාර්යාල පිහිටි පරිශ්‍රය සහ ඉඩම්, පෙර පාසල්, පුස්තකාල හා ආයුර්වේද බෙහෙත් ශාලා වල හිමිකම තහවුරු කර ගෙන ප්‍රාග්ධනිත කර නොතිබුණි.

### 2.4 ආදායම් පරිපාලනය

#### 2.4.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 23,392 | 9,712 | 40,356 | 11,154 | 6,495 | 20,612 |
| (ii) | බදු කුලී | 3,544 | 1,861 | 1,382 | 3,479 | 1,980 | 798 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,367 | 1,972 | 894 | 2,076 | 1,886 | 893 |
| (iv) | වෙනත් ආදායම් | 91,538 | 50,288 | 40,127 | 101,409 | 147,814 | - |

ඉදිරිපත් කර ඇති සංඛ්‍යා ගිණුම් සමඟ නොසැසඳෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

### 2.4.2 ප්‍රචාරක දැන්වීම් ගාස්තු

ප්‍රාදේශීය බල ප්‍රදේශයේ ප්‍රදර්ශණය කර තිබූ ප්‍රචාරක දැන්වීම් පුවරු 04ක් වෙනුවෙන් එකතුව රු. 45,000 ක් වූ මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.4.3 කඩකුලී අයවීම

හෝමාගම නගරයේ බදාදා සහ ඉරුදා දින පොල කඩ බදු දීමෙන් 2010 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී මුදල වූ රු. 35,590 ක අය කර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.4.4 බලපත්‍ර ගාස්තු

2009 දෙසැම්බර් 04 දිනැති අංක 1631 දරණ සාමාන්‍ය ගැසට් පත්‍රයේ පල කර තිබූ නියමයන් අනුව, බලපත්‍ර ගාස්තු අයකර ගත යුතු වුව ද හෝමාගම සහා බල ප්‍රදේශයේ පවතින තේ පැන් ශාලා, හෝටල් , පළතුරු වෙළඳ සැල් හා එළවළු වෙළඳ සැල් 96 කින් 2010 දෙසැම්බර් 31 දනට එකතුව රු. 80,750 ක් වූ හිඟ බලපත්‍ර ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.5 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| **වියදම් විෂයය** | **අයවැයගත** | **තථ්‍ය** | **විචලනය** | **අයවැයගත** | **තථ්‍ය** | **විචලනය** |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **පුනරාවර්තන වියදම්** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 45,811 | 43,101 | 2,710 | 43,308 | 41,198 | 2,110 |
| අනෙකුත් | 66,288 | 97,684 | (31,396) | 59,304 | 93,421 | (34,117) |
| උප එකතුව | 112,099 | 140,785 | (28,686) | 102,612 | 134,619 | (32,007) |
| ප්‍රාග්ධන වියදම | 78,756 | 87,859 | (9,103) | 83,432 | 110,700 | (27,268) |
| මුළු එකතුව | 190,855 | 228,644 | (37,789) | 186,044 | 245,319 | (59,275) |

## 2.6 අය වැය පාලනය

අයවැයගත ආදායම්/වියදම් හා තථ්‍ය ආදායම්/ වියදම් අතර සැලකිය යුතු අවාසි සහගත විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොමැතිබව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 05 | 04 |
| ද්විතියික | 47 | 42 |
| ප්‍රාථමික | 160 | 78 |

**2.8 වත්කම් කළමනාකරණය**

**2.8.1 ලැබිය යුතු ගිණුම්**

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 139,277,519 ක් වූ අතර, කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

**2.8.2 අය වීමට ඇති සේවක ණය**

ස්ථාන මාරු, විශ්‍රාම ගිය, හා මිය ගිය සේවකයින්ගේ 2010 දෙසැම්බර් 31 දිනට අය විය යුතුව තිබූ ආපදා, උත්සව, විශේෂ හා දේපල ණය ශේෂවල එකතුව රු. 2,146,154 ක් විය.

**2.8.3 සමීක්ෂණය නොකළ වත්කම්**

2010 දෙසැම්බර් 31 දිනට සමික්ෂණ මණ්ඩල වාර්තා මඟින් තහවුරු නොවූ පොත් අගය මත ගණන් බැලූ වත්කම් වල වටිනාකම රු. 118,310,622 ක් විය.

**2.9 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**2.9.1 පොදු පහසුකම්**

(අ) පොදු පහසුකම් ඉඩම් 03 කට අදාල මානක සැලසුම් ලිපිගොනු වලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) 1997 ජනවාරි 10 දිනැති අංක 1947/7354 දරණ ඔප්පුවෙන් කැකුණගහලන්ද ඉඩමින් පර්චස් 19 ක ප්‍රමාණයක් විකුණුම්කාර සමාගම විසින් පොදු පහසුකම් සඳහා ප්‍රාදේශීය සභාවට පවරා දී තිබුණි. 2011 පෙබරවාරි 25 දින මෙම ඉඩම් භෞතික පරීක්ෂාවේදී ඉඩම් වල් බිහි වී පැවති අතර, ඉඩම වටා ආරක්ෂිත වැටක් හෝ ඉදිකර, ඉඩම සභාව සතු බවට වන නාමපුවරුවක් සවිකර නොතිබුණි.

**2.9.2 ගබඩා පාලනය**

------------------

හෝමාගම ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2011 පෙබරවාරි 21 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී රු. 3,795 ක් වටිනා බෙහෙත් ද්‍රව්‍ය කල් ඉකුත් වී තිබූ බව නිරීක්ෂණය විය.

**2.9.3 පුස්තකාල පාලනය**

--------------------

හොමාගම සහ වැතර පුස්තකාල වල පසුගිය වර්ෂ කිහිපයක සිට සාමාජිකයන් 574 ක් විසින් නැවත බාර නොදුන් වටිනාකම රු. 143,815 ක් වූ පොත් 958 ක් නැවත ලබා ගැනීම සඳහා හෝ ඒවායේ වටිනාකම අයකරගැනීම සඳහා සභාව විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.10 අභ්‍යන්තර විගණනය**

-----------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ගබඩා පාලනය